# මාධ්‍ය නිවේදනය

## කුවේට්හි සිට ශ්‍රී ලාංකික සිරකරුවන් පිරිසක් රැගෙන ඒම

කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් කුවේට්හි බන්ධනාගාර ගතව සිටි රැඳවියන්ගේ පළමු කණ්ඩායම මාරු කර යැවීම ආරම්භ කරන ලදී.

විවිධ අපරාධ සඳහා දඬුවම් නියමව සිටි රැඳවියන් **32** කින් සමන්විත පළමු කණ්ඩායම, **2024** නොවැම්බර් මස **25** සඳුදා දින කුවේට් ගුවන් හමුදාවට අයත් **C -17** වර්ගයේ විශේෂිත වූ ගුවන් යානයක් මගින් ශ්‍රී ලංකාවට එවීමට නියමිත අතර රැඳවියන් සමග කුවේට් අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ සහ හමුදාවේ නිලධාරීන් පිරිසක් මෙන්ම කුවේට් වෛද්‍ය කණ්ඩායමක්ද ඇතුලත් පරිවාර කණ්ඩායමක් පැමිණීමට නියමිතයි.

මෙම මාරුකර එවනු ලබන රැඳවියන්, දෙරට අතර **2007** වර්ෂයේ අත්සන් තැබූ සිරකරු හුවමාරු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා බන්ධනාගාරවල ඉතිරි කාලය රැඳී සිටිය යුතුවනු ඇත.

පැවති අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් හමුවේ, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ මහත් පරිශ්‍රමයකින් පසුව ශ්‍රී ලංකාවට කිසිදු වැය බරකින් තොරව කුවේට් ගුවන් හමුදාවට අයත් විශේෂිත ගුවන් යානයක් කුවේට් රාජ්‍යයෙන් ලබා ගැනීමට හැකිවීමත් සමග මෙම වසරේ මුල් භාගයේ සිට කල්යමින් විසඳා ගත නොහැකිව තිබූ රැඳවියන් මාරුකර යැවීමේ වැඩසටහන සාර්ථක කරගැනීමට හැකි විය.

**70** කට වැඩි ඉතිරි ශ්‍රී ලාංකික රැඳවියන් පිරිස අදාල බලධාරීන්ගේ අවශ්‍ය නිෂ්කාශන ලැබුණු විගස මාරු කර එවීමට ඉදිරියේදී බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - කුවේට්

**24.11.2024**